# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1435 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br><br>Date | 16/11/2023<br>පැය 2215 |

## මාධ්‍ය නිවේදනය

**තීරු බදු රහිතව මෙරටට ගෙන්වන ලද දුම්වැටි තොගයක් සහිත කන්ටේනර් රථයක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2023.11.16 වන අද දින සවස් කාලයේදී ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ කැළණිතිස්ස විදුලි බලාගාරය අසළදී කන්ටේනර් රථයකින් හෙරොයින් ප්‍රවාහනය කරන බවට ලද තොරතුරක් මත පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් සැකසහිත කන්ටේනර් රථය නවතා පරීක්ෂා කිරීමේදී එම කන්ටේනර් රථය තුල තිබී **තීරු බදු රහිතව මෙරටට ගෙන්වන ලද දුම්වැටි තොගයක්** සමඟ කන්ටේනර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 65 ක් වන මාකොළ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෙය අඩි 40 ක බහාළුමක් වන අතර, එහි එක් කෝටි හැටදාහසකට ආසන්න දුම්වැටි තොගයක් තිබී ඇත. මෙම කන්ටේනර් රථයේ බහාළුම ඔරුගොඩවත්ත බහාළුම් ඒකකය වෙත රැගෙන යන බවට අනාවරණය වී ඇති අතර, අත්අඩංගුවට ගත් සැකකරු ග්‍රෑන්ඩ්පාස් පොලීසියට භාරදීමට නියමිතව ඇත. පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.








**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**